# පරීක්ෂක වාර්තාව

අදියර I විභාගය - 2022 ජනවාරි

## (102) ව්‍යාපාරික ගණිතය සහ සංඛ්‍යානය

(Business Mathematics & Statistics)

---

මෙම ප්‍රශ්න පත්‍රය **A, B** සහ **C කොටස** ලෙස කොටස් 3 කින් සමන්විත වේ.

**A කොටස** අනිවාර්ය වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQ), 15 කින් යුක්ත විය. **1.1** සිට **1.10** දක්වා බහුවරණ ප්‍රශ්න 10 ක් සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 3 බැගින් ලකුණු 30 ක් ද, **1.11** ප්‍රශ්නය සඳහා ලකුණු 4 ක් ද, **1.12** සහ **1.13** කෙටි ප්‍රශ්න සඳහා ලකුණු 2 බැගින් ද **1.14** සහ **1.15** ප්‍රශ්න සඳහා ලකුණු 1 බැගින් ද, **A කොටසේ** මුළු ලකුණු 40 බෙදා වෙන් කරන ලදී.

මෙම **1 වන ප්‍රශ්නයේ** එක් එක් අනු කොටස් සඳහා අයදුම්කරුවන් ලබාදී තිබූ උත්තර අනුව පොදුවේ දක්නට ලැබුණු අඩුපාඩු කිහිපයක් පහත දැක්වේ**:**

## <u>A - කොටස</u>

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නයේ අනු කොටස්වලට දී තිබූ උත්තර අනුව පොදුවේ දක්නට ලැබුණු දුර්වලතා හා නිරීක්ෂණ පහත දැක්වේ:

1.1 මෙම ප්‍රශ්නය මගින් සරල සමීකරණයක් (simple equation) විසඳීමට ලබාදී තිබුණි. විශාල පිරිසක් ඉතා පහසුවෙන් නිවැරදි උත්තරය ලබාදී තිබුණි. නමුත් සමීකරණ විසඳීමේ දැනුම සහ සුළු කිරීමේ දෝෂ නිසා අතලොස්සක් අයදුම්කරුවන් අසාර්ථක වී තිබුණි.

1.2 මෙය සුළු පොලිය ආශ්‍රිත ගැටළුවකි.

$$I = \frac{Ptr}{100}$$

යන සූත්‍රය භාවිත කර, මුළු පොලිය සෙවීම අපේක්ෂා කර ඇත. අයදුම්කරුවන් විශාල පිරිසක් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි.

1.3 සම්භාවිතාවය ආශ්‍රිත සරල ගැටළුවකි. වෙන් (Venn) රූපයක් භාවිත කර හෝ කුලක පිළිබඳ මූලික නීති භාවිතයෙන් අදාල සම්භාවිතාව පහසුවෙන් ලබාගතහැකි වුවත් මූලික සිද්ධාන්ත පැහැදිලිව අවබෝධ කර නොගැනීම නිසා සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසක් අසාර්ථක වී තිබුණි.

1.4 සංඛ්‍යානයේ කේන්ද්‍රික ප්‍රවණතා මිනුමක් වන මාතය (Mode) සෙවීම මෙහිදී අපේක්ෂා කර ඇත. සමූහිත සංඛ්‍යාත ව්‍යාප්තියක් සඳහා මාතය සෙවීම සඳහා,

$M_0 = L_1 + \frac{\Delta_1}{\Delta_1 + \Delta_2} \times C$ යන සූත්‍රය යොදාගත යුතු වුවද, එසේ සිදුකර නොතිබුණි.

1.5 විචල්‍ය දෙකක් අතර ඇති සහසම්බන්ධතා සංගුණකය,

$$r = \frac{[n\sum xy - \sum x \sum y]}{\sqrt{\{[n\sum x^2 - (\sum x)^2] \times [n\sum y^2 - (\sum y)^2]\}}}$$

යන සූත්‍රයට අගයන් ආදේශ කර සුළු කිරීම මඟින් සෙවිය යුතු වුවත්, සුළු කිරීමේ දෝෂ සහ ආදේශ කිරීමේ දෝෂ හේතුවෙන් උත්තර වරදවාගෙන තිබුණි.

1.6 දී ඇති වර්ෂ 2 ක් සඳහා ප්‍රමාණ සාපේක්ෂය (quantity relative), $\frac{q_1}{q_0} \times 100$ යන සූත්‍රයෙන් ඉතා පහසුවෙන් ගණනය කළ හැකිව තිබුණි. අයදුම්කරුවන්ගෙන් විශාල පිරිසක් නිවැරදිව උත්තර සපයා තිබූ අතර, ගැටළුව අවබෝධ කර නොගැනීම නිසා අයදුම්කරුවන් සුළු පිරිසක් අසාර්ථක වී තිබුණි.

1.7 සම්භාවිතාවයේ එන විවික්ත සසම්භාවී සම්භාවිතා ව්‍යාප්තියක අපේක්ෂිත අගය,

$$E(x) = \sum_{z=1}^{n} xi \; P(x = x_1)$$

යන සූත්‍රය භාවිතයෙන් ඉතා පහසුවෙන් ගණනය කළ හැකිව තිබුණි. ගැටළු විසඳීම සඳහා පුහුණුව නොමැතිකමත්, සුළු කිරීමේ දෝෂ නිසාත් සමහර අයදුම්කරුවන් අසාර්ථක වී තිබුණි.

1.8 වැල් පොලිය ආශ්‍රිත ගැටළුවකි. තැන්පතුවේ කල්පිරෙන අගය, $S = A\ (1 + r)^n$ සූත්‍රයෙන් පහසුවෙන් සෙවිය හැකි වුවත් සමහර අයදුම්කරුවන් සුළු කිරීමේ දෝශ සහ ගණක යන්ත්‍ර නිවැරදිව භාවිත නොකිරීමෙන් අසාර්ථක වී තිබුණි.

1.9 කාල ශ්‍රේණි (Time Series) ආශ්‍රිත ගැටළුවකි. දී ඇති උපනති සමීකරණය, $T = 2{,}759 - 177x$ භාවිතයෙන් දී ඇති තොරතුරු උපයෝගී කරගෙන 2022 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත සාමාන්‍ය වාර්ෂික විකුණුම් ප්‍රමාණය සෙවිය යුතු වුවත් ඉතා සියුම්ව දී ඇති දත්තයන් නිරීක්ෂණය කළවිට 2022 විකුණුම් ප්‍රමාණය අඩුම අගය වන 1,520 තෝරාගැනීම ඉතා පහසුවෙන් කළ හැකිව තිබුණි.

1.10 විකුණුම් මිල සහ පිරිවැය ආශ්‍රිත ගැටළුවකි. මෙය ඉතා පහසුවෙන් සමානුපාතික ඇනුම උපයෝගී කරගෙන සෙවීමට හැකිව තිබුණි. එනම්,

| <u>පිරිවැය</u> | <u>විකුණුම් මිල</u> |
|---|---|
| 100 | 115 |
| ? | 3,680 |

$$\text{පිරිවැය} = \frac{3{,}680 \times 100}{115} = \text{රු.3,200/-}$$

1.11 සිට 1.15 දක්වා කෙටි උත්තර ලිවිය යුතු ප්‍රශ්න 5 කි.

1.11 කාල ශ්‍රේණි, ප්‍රතිපායන විශ්ලේෂණය, මූල්‍යමය ගණිතය, ආදි ක්ෂේත්‍රවල අපට හමුවන ශුද්ධ වර්තමාන අගය (NPV), සුන්බුන් අගය, උපනතිය සහ ප්‍රතිපායන විශ්ලේෂණය යන පද කිපයේ අර්ථ දැක්වීම හෝ සම්බන්ධය මෙහිදී විමසා ඇත. අදාල පදය ඉදිරියෙන් එහි පැහැදිලි කිරීමට අදාල අංකය නිවැරදිව දැක්වීම මෙහිදී අපේක්ෂා කළ අතර, අයදුම්කරුවන්ගෙන් සැළකිය යුතු පිරිසක් ගැටළුව හඳුනාගෙන නොමැති බව දක්නට ලැබුණි. මෙම ප්‍රශ්නය පැහැදිලිවම මූලික සිද්ධාන්ත ආශ්‍රයෙන් අසා තිබුණි.

1.12 මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් ඉතාමත් සුළු ප්‍රමාණයක් පමණක් උත්තර ලියා තිබුණු අතර, උත්තර සැපයූ අයදුම්කරුවන්ද ලකුණු කිසිවක් ලබා නොගත් ප්‍රශ්නය මෙය විය. මෙයින් පැහැදිලි වන්නේ අයදුම්කරුවන්ගේ මූලික සිද්ධාන්ත කෙරෙහි අවධානය අඩු බවයි.

1.13 සමාන්තර ශ්‍රේණියක පළමු පද 20 එකතුව සොයා ගැනීම මෙහිදී විමසා තිබුණි.

$$S=\frac{n}{2}\{2a \mid (n\ 1)d\}$$

යන සූත්‍රය භාවිතයෙන් මෙහි පිළිතුර ලබාගත යුතුය. නමුත් ගණක යන්ත්‍ර භාවිත කිරීමෙන් පවා නිවැරදි පිළිතුර ලබාගැනීමට සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසකට අපහසු විය. සමහර සිසුන් අසාර්ථක වී තිබුණේ සුළු කිරීමේ අනුපිළිවෙල හේතුවෙනි. +, - පිළිබඳ රීතිය අනුගමනය නොකර සුළු කිරීම හේතුවෙනි.

1.14 කිසියම් සංඛ්‍යා රටාවක අනුයාත පද ගුණෝත්තර ශ්‍රේණියක බව පැහැදිලි අවබෝධයක් ඇති අයදුම්කරුවන් මෙම ප්‍රකාශය අසත්‍ය බව පහසුවෙන් හඳුනාගෙන තිබුණි.

1.15 සමාන්තර මධ්‍යන්‍ය කේන්ද්‍රක ප්‍රවණතාවේ මිනුමක් බව අයදුම්කරුවන්ට ඉතාම පහසුවෙන් හඳුනාගත හැකිව තිබුණි. ඒ අනුව දී ඇති ප්‍රකාශය නිවැරදි (සත්‍ය) බව බහුතරයක් අයදුම්කරුවන් පිරිසක් දක්වා තිබුණි.

## B කොටස

### ප්‍රශ්න අංක 02

(a) මෙම කොටස මගින් සමගාමී සමීකරණයක් විසඳීම අපේක්ෂා කර තිබූ නමුත් මෙවැනි ඉතා පහසු ගැටළු පවා සමහර අයදුම්කරුවන් සමීකරණ විසඳීමේ දැනුම නැතිකම සහ සුළු කිරීමේ දෝෂ නිසා වරදවාගෙන තිබුණි.

(b) සෑම වර්ෂයකම වැටුප 5% කින් වැඩිවන බැවින් වසර 5 අවසානයේ ඔහුගේ වැටුප ගණනය කිරීමේදී ආරම්භක වර්ෂයේ අවසානයේ වැටුප රු.75,000/- ක් ලෙස හඳුනාගත යුතුය.

නමුත් මෙය නිවැරදිව වටහා නොගෙන, අයදුම්කරුවන් විවිධ වූ වැරදි උත්තර සපයා තිබුණි.

(c) මෙම කොටස දර්ශකාංක සම්බන්ධ ගැටළුවකි. ලැස්පියරේ මිල දර්ශකය (Laspeyre's Price Index) අදාළ සූත්‍රය, $\frac{\sum p_1 q_0}{\sum p_0 q_0} \times 100$ ප්‍රශ්න පත්‍රයේ සූත්‍ර පත්‍රිකාවේ ලබා දී තිබුණත් අයදුම්කරුවන්ගෙන් වැඩි පිරිසක්

$\frac{\sum q_1 p_0}{\sum q_0 p_0} \times$ 100 ආකාරයෙන් ඉතා වැරදි සහගත ලෙස $\sum$ අංකනය යොදා තිබුණි. $\sum$ (සිග්මා) අංකනය සහිත ගණිත කර්ම පිළිබඳ අයදුම්කරුවන් මීට වඩා සැලකිලිමත් විය යුතුය.

### ප්‍රශ්න අංක 03

(a) මුළු පිරිවැය [Total Cost (TC)] ශ්‍රිතය සහ මුළු ආදායම් [Total Revenue (TR)] ශ්‍රිතය හඳුනා ගැනීම මෙම කොටසින් විමසා තිබුණි.

මුළු පිරිවැය ශ්‍රිතය = විචල්‍ය පිරිවැය + ස්ථාවර පිරිවැය බව අයදුම්කරුවන් අවබෝධ කරගෙන නොමැති වීමෙන් අසාර්ථක වී තිබුණි.

(b) ආන්තික පිරිවැය සෙවීම සඳහා මුළු පිරිවැය ශ්‍රිතය අවකලනය කළ යුතුව තිබුණි. මුළු ආදායම් ශ්‍රිතය සෙවීම සඳහා ඉල්ලුම් ශ්‍රිතය, භාණ්ඩ ඒකක ප්‍රමාණයෙන් ගුණ කළ යුතු බවත් සහ ආන්තික ආදායම සඳහා ආදායම් ශ්‍රිතය අවකලනය කළ යුතු විය. මෙහිදී අවකලනයෙහි එන බලයක අවකලන (power rule) රීතිය නිවැරදිව යොදා ගැනීමට අයදුම්කරුවන් අසමත් වී තිබුණි.

(c) සමච්ඡේදන ඒකක ප්‍රමාණය සඳහා මුළු පිරිවැය ශ්‍රිතය සහ මුළු ආදායම් ශ්‍රිතය සමානවන ඒකක සංඛ්‍යාව සෙවිය යුතු වුවත් එම සමීකරණය විසඳීම තුලින් q ලබාගැනීම විශාල අයදුම්කරුවන් පිරිසක් සාර්ථකව සිදුකර නොතිබුණි. අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනෙක් TC = TR වෙනුවට MC = MR ලෙස වැරදි ආකාරයට ගෙන තිබුණි.

## ප්‍රශ්න අංක 04

(a) ප්‍රතිපායන විශ්ලේෂණයේ එන විචල්‍ය දෙකක් අතර ඇති සහසම්බන්ධය ලබාගැනීම ආශ්‍රිත ගැටළුවකි. දී ඇති වගුවේ ප්‍රචාරණ පිරිවැය සහ විකුණුම් ප්‍රමාණය අතර, $y = a + bx$ රේඛීය සම්බන්ධය හඳුනාගැනීම මෙයින් අවශ්‍ය කෙරිණි.

$y = a + bx$ සමීකරණයේ ‘a’ සහ ‘b’ සඳහා අගයන් දී ඇති සූත්‍ර පත්‍රිකාවේ,

$$b = \frac{[n\sum xy - \sum x \sum y]}{[n\sum x^2 - (\sum x)^2]} \quad \text{සහ} \quad \bar{y} = a + b\bar{x}$$

යන සූත්‍ර මඟින් සෙවිය යුතු විය. ඒ වෙනුවට සමහර අයදුම්කරුවන් $x$ සහ $y$ අතර විසිරිතිත් සටහනක් ඇඳ එමඟින් සම්බන්ධයක් දැක්වීමට උත්සාහ කර තිබුණි.

(b) දී ඇති වගුවේ අගයන් '000 ඒවාවලින් දක්වා ඇති බැවින් 25,000 දී විකුණුම් ප්‍රමාණය ලබාගැනීමට $x = 25$ විට $y$ සොයා එය දහසෙන් ගුණ කිරීම වෙනුවට සම්බන්ධයට $x = 25{,}000$ ආදේශ කර තිබුණි.

## ප්‍රශ්න අංක 05

සංඛ්‍යානයේ එන කේන්ද්‍රික ප්‍රවණතා පිළිබඳ මිනුම් දී ඇති සමූහිත සංඛ්‍යාත ව්‍යාප්තියෙන් ලබා ගැනීම අපේක්ෂා කර තිබුණි. ඉන්පසු විචලන සංගුණකය සෙවීම අපේක්ෂා කර තිබුණි.

(a) අයදුම්කරුවන්ගෙන් සැළකිය යුතු පිරිසකට එක් එක් පන්ති ප්‍රාන්තරවල මධ්‍ය අගය (Mid Value) ලබා ගැනීමේදී සිදුකරන ලද වැරදි නිසා මධ්‍යන්‍යය නිවැරදිව ලබා ගැනීමට නොහැකි වී ඇත.

(b) අයදුම්කරුවන්ගෙන් බහුතරය විචලතාවය සෙවීමේදී,

$$S^2 = \frac{\sum_{i=1}^{n} fi\, xi^2}{\sum f} - \bar{x}^2$$ සූත්‍රය නිවැරදිව සොයාගෙන නොතිබුණි.

සමහර අයදුම්කරුවන් $\sum_{i=1}^{n} fi\, xi^2$ වෙනුවට $\sum_{i=1}^{n} (f_i x_i)^2$ වශයෙන් දක්වා ගණනය කර තිබුණි.

ඉහත සඳහන් කළ දෝෂය හේතුවෙන් සම්මත අපගමනය ද වරදවාගෙන තිබුණි.

(c) මෙහිදී $\frac{\text{සම්මත අපගමනය}}{\text{මධ්‍යන්‍යය}} = \frac{\sigma}{\bar{x}} \times 100$

සූත්‍රය භාවිත කර විචල්‍යතා සංගුණකය සෙවීම අවශ්‍ය විය. මෙහිදී සමහර අයදුම්කරුවන් 100% ගුණ කිරීම සිදුකර නොතිබූ අතර, තවත් සමහරු සම්මත අපගමනය වෙනුවට විචලතාවය යොදාගෙන තිබුණි.

<u>C කොටස</u>

**ප්‍රශ්න අංක 06**

මුළු ලකුණු 20 ක් හිමිවන මෙම ප්‍රශ්නය කොටස් 4 කින් සමන්විත විය.

(A) (a) මූල්‍ය ගණිතයේ එන වාර්ෂික ණය වාරිකය ගණනය කිරීම මෙහිදී අපේක්ෂා කර තිබුණි. ඒ සඳහා,

$$A = \frac{SR^n(R-1)}{\{R^n - 1\}}$$

සූත්‍රය හෝ 8% සමුච්චිත වට්ටම් සාධකය වන 2.577 යොදා නිවැරදි උත්තරය පහසුවෙන් ලබාගත හැකිව තිබුණි. අයදුම්කරුවන් සැලකිය යුතු පිරිසක් සූත්‍රයට නිවැරදිව ආදේශ කළත් නිවැරදිව සුළු කර A ලබාගැනීමට අපොහොසත්ව තිබුණි.

(b) ණය ආපසු ගෙවීම පෙන්නුම් කිරීම සඳහා ක්‍රමක්ෂය කිරීමේ උපලේඛණය (amortization table) පිළිබඳ අවබෝධය බහුතරයක් අයදුම්කරුවන්ට නොතිබුණි.

(B) දී ඇති ව්‍යාප්ති දෙක සඳහා එක් එක් විකල්පය සඳහා ශුද්ධ වර්තමාන අගය සොයා එම අගයන් දෙක සංසන්දනය කර වඩා ලාභදායී ව්‍යාප්තිය තෝරා ගැනීම පිළිබඳ දැනුම මෙහිදී අපේක්ෂා කර තිබුණි. අයදුම්කරුවන් සැලකිය යුතු පිරිසක් අදාල NPV අගයන් නිවැරදිව ලබාගෙන නොතිබූ අතර, සමහරු වර්තමාන අගයන්වල එකතුවෙන් ආරම්භක අගය අඩුකර නොතිබුණි.

තවත් සමහර අයදුම්කරුවන් NPV අගයන් දෙක ලබාගත්ත ද වඩා සුදුසු විකල්පය කුමක්දැයි වෙන්කර ගැනීම අපොහොසත්ව තිබුණි.

(C) මෙය සම්භාවිතාවේ එන අසම්භාවී සම්භාවිතාව ආශ්‍රිත ගැටළුවකි.

$$P(B/A) = \frac{P(A \cap B)}{P(B)}$$

අර්ථ දැක්වීම යොදා පහසුවෙන් සෙවිය හැකිව තිබුණි. සමහර අයදුම්කරුවන් මෙම අර්ථ දැක්වීම වෙනුවට වෙන් රූපයක සම්භාවිතා ලකුණු කර උත්තරයක් ලබාගැනීමට උත්සාහ කර තිබුණි. නමුත් සමහර අයදුම්කරුවන් පෙරවැඩ කිසිවක් නොපෙන්වා එකවර උත්තර දක්වා තිබීම ගැටළු සහගත විය.

(D) ප්‍රමිත ව්‍යාප්තියකින් අදාල සම්භාවිතාව ලබා ගැනීම මෙහිදී අපේක්ෂා කර ඇත.

$X \sim N(\mu = 2.5,\ \sigma = 0.45)$ නිසා P (X x 3) සෙවීමේදී

$$Z = \frac{3 - 2.5}{0.45} = 1.11$$

මෙහිදී $Z = \frac{X - \mu}{\sigma}$ වෙනුවට සමහරු $Z = \frac{\mu - X}{\sigma}$ ලෙස ගෙන වැරදියට ගණනය කර තිබුණි.

සම්මත ප්‍රමත වගුව නිවැරදිව කියවා අවශ්‍ය සම්භාවිතාව ලබාගැනීම පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම අඩු මට්ටමක තිබුණි.

--------

**විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:**

(1) නව විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම.

(2) අවශ්‍ය තැන්වලදී පෙරවැඩ පැහැදිලිව පෙන්විය යුතුය.

(3) සූත්‍ර පිටපත් කිරීමේදී සහ සූත්‍ර වලට ආදේශ කිරීමේදී සැලකිලිමත් විය යුතුය. සමහර ප්‍රශ්න සඳහා උත්තර සැපයීමේදී සූත්‍ර කීපයක්ම යොදාගත හැකි අතර ඉන් වඩාත්ම පහසු සූත්‍රය යොදා ගැනීම. තවද සූත්‍ර පත්‍රිකාවෙන් සූත්‍ර පිටපත් කිරීමේදී "+" හා "-" ලකුණු මාරු නොකර සටහන් කර ගැනීමට වගබලාගත යුතුය.

(4) සමහර සූත්‍ර මගින් විසඳිය යුතු ප්‍රශ්න වලදී අයදුම්කරුවන් සූත්‍රය ලියා අගයන් ආදේශ කිරීම නොපෙන්වා ගණක යන්ත්‍රය මගින් අවසන් උත්තරය පමණක් ලබාගෙන සටහන් කර තිබුණි. නමුත් අයදුම්කරුවන් සූත්‍රය ලියා එයට නිවැරදි අගයන් ආදේශ කර උත්තරය ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම යෝග්‍ය වේ. මෙහිදී අවසාන උත්තරය නිවැරදි නොවන අවස්ථාවලදී අදාල පියවරයන්වලට ලකුණු ලබාගැනීමට හැකියාව පවතී.

(5) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

(6) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(7) පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

(8) කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

(9) උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

(10) එක් ප්‍රශ්නයක උත්තරය අවසානයේ ඊළඟ ප්‍රශ්නය අලුත් පිටුවකින් ආරම්භ නොකර, පෙර පිටුවේ ඉතා කුඩා ඉඩක අලුත් ප්‍රශ්නය ආරම්භ කළ අවස්ථා බොහෝ තිබුණි. සැමවිටම අළුත් ප්‍රශ්නයක් අළුත් පිටුවකින් ආරම්භ කිරීමට අයදුම්කරුවන් වගබලා ගත යුතුය.

(11) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -